ඉකුත් සතියේ ශ්‍රී ලංකාවේ සංචාරයකින් පසු ඕස්ට්‍රේලියාව බලා පිටත්ව යන අවස්ථාවේදී කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ දී පැය 12 ක පමණ කාලයක් රැඳී සිටීමට අජාන් බ්‍රහ්මවංසෝ හිමිට සිදු වූ බව මාධ්‍ය වාර්තා කර තිබිණි.

ඉන් අනතුරුව, ඕස්ට්‍රේලියාවේ පර්ත් නගරයේදී උන්වහන්සේ ඒ සම්බන්ධයෙන් අදහස් දක්වා තිබූ අතර, එම අදහස් දැක්වීම ද මාධ්‍ය අවධානයට ලක් වුණි.

ඒ පිළිබඳව Ethics Eye නිරීක්ෂණයන් මෙසේ පෙළගැස්විය හැක.

* මෙම සිදුවීම සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී, අජාන් බ්‍රහ්මවංසෝ හිමිගේ අදහස් දැක්වීම ඉදිරිපත් වී තිබුණේ සිරස ටීවී සහ ස්වර්ණවාහිනී රාත්‍රී ප්‍රධාන පුවත් විකාශයන් තුළ පමණක් බව නිරීක්ෂණය කළ හැකි විණි.

* කෙසේ නමුත්, පුවත් විකාශයන් දෙකම තුළ අජාන් බ්‍රහ්මවංසෝ හිමියන්ගේ අදහස් දැක්වීම සිංහල හඬකවා වාර්තා වුවත්, ස්වර්ණවාහිනී පුවත් විකාශය තුළ දැක්වී තිබුණු වීඩියෝව, සිරස ටීවී පුවත් විකාශය තුළ දැක්වී තිබූ වීඩියෝවට හාත්පසින්ම වෙනස් බවද නිරීක්ෂණය විණි.

* තවදුරටත් කරුණු සෙවීමේදී, සිරස ටීවී පුවත් තුළ අජාන් බ්‍රහ්මවංසෝ හිමියන් මෙම සිදුවීම සම්බන්ධයෙන් අදහස් දක්වන නිවැරදි වීඩියෝව පළ වී තිබූ බව සනාථ කරගත හැකි විණි.

* ස්වර්ණවාහිනී පුවත් විකාශය තුළ, සිංහල හඬ කවා තිබූ පරිවර්තනය මෙම සිදුවීමට අදාළව බ්‍රහ්මවංසෝ හිමියන්ගේ අදහස් ඉදිරිපත් කිරීම වුවත්, එම වීඩියෝව සැබවින්ම බටහිර ඕස්ට්‍රේලියාවේ බෞද්ධ සංගමය මඟින් මැයි 20, 2023 දින ඉදිරිපත් කර තිබූ භාවනා සම්බන්ධ වැඩසටහනක වීඩියෝවක් බවද නිරීක්ෂණය කළ හැකි විණි.

1) නිරවද්‍යතාව මාධ්‍ය ආචාර ධර්මයන් හි ප්‍රමුඛ කොන්දේසියක් වේ. එසේ නම්, මෙය මිනිස් දෝෂයක් නිසාවෙන් සිදුවූවා විය හැකි වුවත්, එවන් වැරදීම් අවම කරගැනීමට මාධ්‍ය ප්‍රවේසම් විය යුතු නොවන්නේ ද?

සිරස ටීවී පුවත් ඉදිරිපත් කිරීම: https://www.youtube.com/watch?v=-Fn3Zeo7UoY&t=1316s...

ස්වර්ණවාහිනී පුවත් ඉදිරිපත් කිරීම: https://youtu.be/lal8fPPVbiQ?t=925

අජාන් බ්‍රහ්මවංසෝ හිමි ගේ නිවැරදි මුල් අදහස් දැක්වීම: https://www.youtube.com/live/iffN3uTNCnQ?feature=share...

ස්වර්ණවාහිනී ඉදිරිපත් කොට තිබූ, නිරවද්‍ය නොවන වීඩියෝවට අදාළ සැබෑ වීඩියෝව: https://youtu.be/0s5aYVaAi2E?t=43